# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිඩකරණලදී.

නො. 7,026 — 1919ක්වූ ජූනි මස 27වෙනි දිනවූ සිකුරාද.

# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**No. 2,544, C. P.**—මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 29වෙනි දිනවූ සිකුරාද පස්වරු 2ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩබුලත්ගම කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

සිතියම 6,882. ගම—පස්බාගේකෝරළේ පල්ලේගම. අයිතිකාමකියන්නා—ආණ්ඩුව.

| නො | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | ආදන්ගොඩවත්ත | ආදන්ගොඩවත්තේ ඇෆ්. එච්. බෝබාන් මහතා | තේ ඉඩම (ආණ්ඩුවේ ඉඩමෙන් අල්ලාගන සිටි) | 0 0 30 | 500 |
| 2 | එම | එම | තේ සහ රබර් වැවිච්ච ඉඩම | 0 1 22 | 500 |
| 5 | ගැටදෙනියේපතන | — | පතන (කොඩිගහ සිටවීමට ඉතුරුකර තිබෙන භූමිය) | 0 2 16 | —* |
| 7 | කෙහෙල්ගොල්ලේ පතන සහ කෙහෙල්ගොල්ලේ මූකලාන | ඇෆ්. එච්. බෝබාන් | පතන සහ කැලය (කෙහෙල්ගොල්ලේ ඇලට ඉතුරුකර තිබෙන හරිය) | 5 0 31 | —* |

සිතියම 6,782. ගම—පස්බාගකෝරළේ වැලිගම්පල.

| නො | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | හින්ඩිෆොඩ්වත්ත | හින්ඩිෆොඩ්වත්තේ ආර්. ඒ. එච්. ඩිකින්සන් | රබර් වවා තිබේ (ආණ්ඩුවේ ඉඩමෙන් අල්ලාගණ තිබේ) | 2 1 5 | 500 |
| 2 | එම | එම | එම | 0 0 35 | 500 |

* විකිනීමට නොවේ.

මේ ඉඩම් ගැන වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1919ක්වූ ජූනි මස 23වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වර්ග.

---

මධ්‍යම පලාතේ මහඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 8වෙනි සිකුරාද හෝ ඊට මත්තෙන් මහනුවර කච්චේරියේදී තේ වැවීම පිණිස මෙහි පහත සඳහන්කරණ ආණ්ඩුව සන්තක ඉඩම් කැබෙලි බද්ද පටන්ගත් දින සිට අවුරුදු තිහකට වතාවක් බදුමිල නැවත බලා හරිගස්සන බැවින් එම නියෝගයට යටත්කර, වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් කාල සීමාවක් නොමැතිව, බදු ගැණීමට ඉල්ලා ලියාඑවනලද ඉල්ලුම්පත්‍ර භාරගැණීමට බලාපොරොත්තුව සිටින්නේය. ඉල්ලුම්කරණ අයවලුන්ගේ සම්පූර්ණ නම් සහ පදිංචිය සඳහන් නොකළ ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. තවද මහ ඒජන්ත උන්නාන්සේ වෙත එක එක බිම්කැබෙල්ලට ලකුණුකර තිබෙන අන්දමට මිනින්දෝරු ගාස්තුව තැන්පත් කොට තැබිය යුතුයි. එසේ නොකරන්නන්ගේ ඉල්ලුම්පත්‍රද භාරගනු නොලැබේ. ඉඩමේ බද්ද විකුණන්ට පෙර හෝ ඉඩමේ බද්ද විකිනීම නොකරණවායයි මහඒජන්ත උන්නාන්සේ විසින් නියමයකරගන්නාතුරු ඉහතකී අන්දමින් තැන්පත්කරණලද මුදල් ආපසු ගෙවනු නොලැබේ. ආණ්ඩුවට අයිති ඉඩම් බදුදෙන ආඥාපණත යටතේ එකී වගන්තිවලට අනුව වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 29වෙනි දිනවූ සිකුරාද පස්වරු 1·30ට මහනුවර කච්චේරියේදී බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙනවා ඇත. බද්ද ගැනුම්කාරයාවෙන්නේ ඉතා වැඩි මුදලට ඉල්ලුම්අයවේ. බද්ද වෙන්දේසියේදී ඉල්ලුම්කරන්ට පුළුවන් වන්නේ මුල් ඉල්ලුම්කාරයාට සහ ඉහතකී ප්‍රකාරයට මුදල් බැඳ ඉල්ලුම්කරපු අයවළුන්ට පමණකි.

මේ ඉඩම්වල බද්දේ කොන්දේසි මහඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩබුලත්ගම කොටසයේ පස්බාගේකෝරළේ පිහිටි ආණ්ඩුවට අයිති ඉඩම්කැබලි 4ක්.

සිතියම 6,882. ගම—පල්ලේගම.

| නො. | ඉඩමේ නම. | විස්තරය. | බිම්හරම. අ. රූ. ප. | අක්කරයකට නොකොත් ඉන් කොටසකට මැනීමේ ගාස්තු රු. | අක්කරයක තක්සේරු මිල, රු. | මුල් 30 අවුරුද්දට, අවුරුදු පතා අක්කරයකට ගෙවියයුතු බදු මිල. පළමුවෙනි 6 අවුරුද්දේ එක එක අවුරුද්දට රු. | මුල් 30 අවුරුද්දට, අවුරුදු පතා අක්කරයකට ගෙවියයුතු බදු මිල. ඉතුරු අවුරුදු 24රේ එක එක අවුරුද්දට රු. |
|---|---|---|---|---|---|---|---|
| 3 | කෙහෙල්ගොල්ලේමූකලාන | කැලය තේ වැවීමට) | 2 3 13 | 4 | 17 | 2 | 6 |

| අංකය. | ඉඩමේ නම. | විස්තරය. | බිම් තරම. අ. රූ. ප. | අක්කරයකට හෝ නොහොත් ඉන් කොට අක්කරයක සතට මැනීමේ ගාස්තු. රු. | අක්කරයක තක්සේරු මිල රු. | මුල් 30 අවුරුද්දට, අවුරුදුපතා අක්කරයකට ගෙවියයුතු බදු මිල. පළමුවෙනි අවුරුදු 6යේ එක එක අවුරුද්දට රු. | මුල් 30 අවුරුද්දට, අවුරුදුපතා අක්කරයකට ගෙවියයුතු බදු මිල. ඉතුරු අවුරුදු 24රේ එක එක අවුරුද්දට රු. |
|---|---|---|---|---|---|---|---|
| 4 | කෙහෙල්ගොල්ලේපතන | පතන (එම) | 9 2 28 | 4 | 17 | 2 | 6 |
| 6 | එම | එම | 3 2 29 | 4 | 17 | 2 | 6 |
| 8 | එම | එම | 3 1 0 | 4 | 17 | 2 | 6 |

වර්ෂ 1919ක්වූ ජූනි මස 23 වෙනි දින කොළඹ
මහලේකම්තුමාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 3,547 S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 26වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ තල්පේපත්තුවේ කොඩිඅසගේ පිහිටා තිබෙන බිම්කැබලි 10ක්.

සිතියම 10,554. ගම—බඡ්නාහිර උනවටුන. අයිතිකමකියන්නා—ඒ. ඩී. ජයසුන්දර.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 1 | රූමස්සලකන්ද | — | එලිකරපු බැද්ද | 0 1 16 | 105 |
| | | | වැවිල්ල | — | 5 |
| | සිතියම 10,759. ගම—පරගොඩ. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | |
| 1 | විහාරේගොඩකන්ද නොහොත් වත්තිආච්චිගේගොඩවත්ත ගාවාකන්ද | පරගොඩ පදිංචි ඊ. මොහොට්ටිගේ සිය දෙරීස් | සුළු බැද්ද | 1 0 29 | 42 |
| | සිතියම 10,814. ගම—කෝම්බල. | | | | |
| 1 | කොස්මුල්ලේගොඩ | කෝම්බලලියනගේ කොර්නේලිස් | බැද්ද | 1 0 0 | 61·50* |
| | සිතියම 10,888. ගම—හව්පේ. | | | | |
| 1 | රුකමුල්ලේවත්තේගොඩ | උපාසකගේ හින්නිබබා | පතන | 0 2 9 | 62·50 |
| 2 | දෙල්ගහකනත්ත | පල්ලේගේ තොන්නොහාමි | සුළු බැද්ද | 0 2 5 | 61 |
| 3 | එම | එම | එම | 0 3 35 | 62·50 |
| | සිතියම 11,023. ගම—කොට්ටව. | | | | |
| 2 | මාරගහමුලන | කොට්ටව පදිංචි ජී. කේ. හඳෙරීස් | හේන | 1 0 5 | 66† |
| | සිතියම 11,175. | | | | |
| 1 | මැදිදූවේගොඩ | — | බැද්ද | 2 3 17 | 65‡ |
| 2 | එම | කොට්ටව යද්දෙහිගේ අදෙරීස් | එම | 0 3 36 | 65‡ |
| | සිතියම 11,177. | | | | |
| 1 | බඹරමුල්ලේකන්ද | මාබොටුවන පදිංචි ඇන්. ඒ. තෙබේරිස් | එම | 1 0 0 | 70 |
| 2 | එම | — | බැද්ද (විකුනන්නේ නැහැ) | 0 0 27 | —§ |
| 3 | එම | — | එම | 0 1 17 | —§ |

* මිනිරන් හෑරීමේ බලය ඇතුව අක්කරයක් රු. 160. ‡ මිනිරන් හෑරීමේ බලය ඇතුව අක්කරයක් රු. 165.
† මිනිරන් හෑරීමේ බලය ඇතුව අක්කරයක් රු. 166. § තහනම් ඉඩම්.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණා ගාල්ලේ මහා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්නට පුළුවන.

වර්ෂ 1919ක්වූ ජූනි මස 23වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 3,548, S. P.**—දකුණු දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 19වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාලු පලාතේ බෙන්තර වලල්ලාවිටිකෝරළේ කොඩිඅසගේ පිහිටාතිබෙන බිම්කැබලි 12ක්.

සිතියම 11,164. ගම—කුඹුරුගහ. අයිතිකමකියන්නා—රජසන්තක.

| අංකය. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | ගල්ගොඩවත්ත | — | පොල්වත්ත | 1 0 7 | 100 |
| | | | වැවිල්ල | — | 29.25 |
| 2 | කජුගස්දූවේවත්ත | — | කොස් තිබෙන වත්ත | 0 2 7 | 100 |
| | | | වැවිල්ල | — | 49.95 |
| 3 | කජුගස්දූව | වැලිතර බබලිව්. ලැයිරිස් ද සිල්වා | සුළුබැද්ද | 1 0 18 | 110 |
| 4 | කජුගස්දූවබිම්ට | — | අලජාති සිටවාපු | 0 1 2 | 100 |
| 5 | එම | — | අල ජාති (විකුණන්නේ නැහැ) | 0 0 8 | —* |
| 6 | එම | — | අලජාති | 0 2 20 | 50 |
| | | | වැවිල්ල | — | 1 |
| 7 | කජුගස්දූව | වැලිකන්දේ බී. කරෝලිස් ද සිල්වා | සුළුබැද්ද | 0 3 28 | 110 |
| 8 | එම | වැලිකන්දේ පී. ජේම්ස් ද සිල්වා | එම | 0 3 25 | 110 |
| 9 | එම | එම | එම | 1 0 2 | 110 |
| 10 | එම | වැලිකන්දේ පී. අල්විස් ද සිල්වා | එම | 0 3 32 | 110 |
| 11 | එම | — | පොල්ගස් 14ක් සහිත ඉඩම | 0 1 19 | 100 |
| | | | වැවිල්ල | — | 19.50 |
| 12 | එම | — | සුළු බැද්ද (විකුණන්නේ නැහැ) | 0 1 2 | —* |
| 15 | එම | — | පොල් සහිත ඉඩම) | 0 0 37 | 100 |
| | | | වැවිල්ල | — | 8.20 |
| 16 | එම | වැලිකන්දේ බී. කරෝලිස් ද සිල්වා | සුළුබැද්ද | 1 0 0 | 110 |

* තහනම් ඉඩම්.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු දකුණු පලාතේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1919ක්වූ ජූනි මස 24වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

**No. 3,549, S. P.**—දකුණු දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 19වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ කඩවත්සතරතුළ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

සිතියම 11,225. ගම—කලුවැල්ල. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | — | .. සුබවූ ගෞරවාර්හනිත වැන්රීත් බිෂොප් උන්නාන්සේ | ජෝසප් සුදුහුණෙන් බැඳපු ලිඳක්ද, කඩාගිය නාන ගේක සුදුහුණෙන් බැඳපු අවූ රුදු 6ක් කල්ගිය කනු | .. 0 0 1·80 | 15,000 |
| | | | ගොඩනැගිලි සහ ලිඳත් | .. — | 250 |

මෙම බිම්කැබෙල්ල ගැණ වැඩිදුර කාරණ දකුණු පලාතේ මහා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්නට පුළුවන.

වර්ෂ 1919ක්වූ ජූනි මස 24වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීයි.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

---

**No. 3,550, S. P.**—දකුණු දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සනතක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 23වෙනි දිනවූ බෘහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ වැල්ලබඩපත්තුවේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

සිතියම 11,082. ගම—මලවැන්න. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | රෙම්මදකුඹුරේගොඩ නොහොත් වැදඹුවකැලේ | .. කේ. විජේනායක | .. මහබැද්ද .. | .. 1 3 34 | 80 |
| 2 | එම .. | එම | .. එම .. | .. 1 2 37 | 80 |
| 3 | එම .. | එම | .. එම .. | .. 1 3 37 | 80 |
| 4 | එම .. | එම | .. එම .. | .. 1 3 9 | 80 |
| 5 | එම .. | එම | .. සුළුබැද්ද (විකුණන්නේ නැහැ) | .. 0 1 20 | —* |
| 6 | එම .. | එම | .. මහබැද්ද (විකුණන්නේ නැහැ) | .. 0 1 7 | —* |

* තහනම් ඉඩම්.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ගාල්ලේ මහා ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්නට පුළුවන.

වර්ෂ 1919ක්වූ ජූනි මස 24වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

---

නුවරකලාවිය දිස්ත්‍රික්කේ මෙහි පහත සඳහන් මිනිරන් තිබෙනවායයි විශ්වාසකරණ රජසන්තක ඉඩමේ මිනිරන් හෑරීමේ අයිතිවාසිකම් මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව අවුරුදු 5ක කාලයට වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 15වෙනි දිනවූ සිකුරාදා පස්වරු 2ට අනුරාධපුර කච්චේරියේදී උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බේරුම්කරණවා නොහොත් විකුණනවා ඇත.

(*a*) බදු දෙන්ට යෙදෙන්නේ මිනිරන් හෑරීමේ බලය පමණක්ය. තවද මෙකී බද්ද අවුරුදු පහකටය, ඉඩමෙන් ලැබෙන මිනිරන් සියල්ලෙන් සීයෙන් දසකොටසක් ආණ්ඩුවට දියයුතුවේ. මෙම බද්ද ආණ්ඩුව විසින් අවසරදී තිබෙන කොන්දේසිවලට යටත්වේ. එම කොන්දේසිවල පිටපත් කච්චේරියෙන් ලබාගතහැක. පහත සඳහන් ඉඩම් කට්ටියේ බද්ද ගැනුම්කාරයා වැඩි ඉල්ළුම්කාරයාවේ. නමුත් ඔහු විසින් ඉල්ලන මුදල මෙහි අඳල පත්‍රයේ 4වෙනි කොට්ඨාසයේ ලකුණුකර තිබෙන තක්සේරු මුදලට අඩුනොවිය යුතුවේ.

(*b*) ඉහතකී මුදලක් තැන්පත්කර තිබුනත් නැතත් වැඩි ඉල්ළුම්කාරයා හැටියට තීන්දුකල වහාම ඉල්ලනලද ගණනෙන් සීයෙන් දසකොටසක් ඒජන්ත උන්නාන්සේට දී ඉහත සඳහන් කොන්දේසිවලට අත්සන් තබනතුරු විකිනීම ස්ථිර කරණු නොලැබේ.

(*c*) විකිණීමේ මුදලේ ඉතුරු කොටස විකිණීමේ දිනේ සිට මසක් ඇතුලතදී ගැනුම්කාරයා විසින් ඒජන්ත උන්නාන්සේට ගෙවන්ට ඕනෑය. එසේ නොකලොත් විකිණීම අවලංගු වෙනවා පමණකුත් නොව ගැනුම්කාරයා විසින් ගෙවන්ට යෙදුන සීයෙන් දසකොටස සහ මේ ඉඩම සම්බන්ධව ගෙවන්ට යෙදුන වෙනයම් මුදලුත් සමග රජසන්තකවේ.

(*d*) නියම කාලයතුල මුළු මුදල ඒජන්ත උන්නාන්සේට ගෙවන්ට යෙදුනොත් පිළිගෙණ තිබෙන පෝර්මයේ බදු ඔප්පුවක් ගැනුම්කාරයාට දෙනු ලැබේ. තවද ගැනුම්කාරයා විසින් එහි පිටපතක් අත්සන්කර ඒජන්ත උන්නාන්සේට බාරදිය යුතුවේ.

(*e*) ඉහතකී ඉඩමේ විස්තරයේ හෝ වපසරියේ වැරදීමක් මිටපසු පෑහැදුනාට ඒ වෙනුවෙන් අලාභයක් ඉල්ලන්ටවත් ගැනුම්කාරයාට අයිතිකමක් නැත.

(*f*) බදු ඔප්පුව සකස්කිරීමේ ගාස්තුව මුල්මුදලෙන් සියයට හතරක්ය, නමුත් එම ගාස්තුව රුපියල් 20ට වැඩි නොවිය යුතුවේ. මෙම මුදල වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 15වෙනි දින ගෙවන්ට ඕනෑය.

(*g*) බද්ද අවසානයේදී භාරනලද පතල් වසා දමන්ට ඕනෑය.

(*h*) ගැණුම්කාරයා විසින් ඉහතකී ඉඩමේ තිබෙන ලිඳඹුවල ප්‍රවේසම පිණිස විකිණීමේ දිනේ සිට සතියක් ඇතුළතදී රුපියල් 5,000ක් ඇප බැඳිය යුතුවේ.

එච්. ආර්. ප්‍රිමන්,
උ. ම. දි. ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1919ක්වූ ජූනි මස 16වෙනි දින
අනුරාධපුර කච්චේරියේදීය.

අඳල පත්‍රය.

නො. 3,758 දරණ සිතියම. කල්පේකෝරලේ පහල කල්පේතුලාතේ පලුගස්වැව.

| නො. | ඉඩමේ නම. | වපසරිය, අ. රූ. ප. | තක්සේරු මිල, රු. |
|---|---|---|---|
| 200 | පලුගස්වැවකැලේ | .. 30 3 34 | 31 |

---

**No. 1,354, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 29වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ උඩුනිද කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

සිතියම 30. ගම—උඩුනිද දෙහිවිනිපලාතකෝරලේ පෙරහෙවියේගම.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 65x | පහලනිලපතන නොහොත් හරස්හින්න | .. ආණ්ඩුව .. .. .. | පතන | .. 62 1 18 |
| 65AH | කෙකෙල්අත්තේඅරාවේපතන | .. එම .. .. .. | එම | .. 67 2 35 |

බදු කොන්දේසි.

(a) ඉහත සඳහන්වෙන ඉඩම් සදාකාලිකෝට බදුදෙනු ලැබේ.
(b) මෙම ඉඩම් එකින් එකට "පිරිමියම්" වන තක්සේරු මුදල් මෙසේය. රුපියල් 346.50, රුපියල් 374ක් වේ.
(c) අවුරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකට වුවත් බදුමුදල රුපියල් 2·50ක් වේ.
(d) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදු මුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක් වේ.
(e) ඒජන්ත උන්නාන්සේගේ අවසර නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.
(f) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගාපලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය නියා පලකරනු ලැබේ.
(g) තේ වැවීමට උචිතනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනු ලැබේ.
(h) ඉඩම් තේ වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි.
(i) බදුකාරයා විසින් මෙම ඉඩම් අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද, ඉතුරු ඉඩම් තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දුවිය යුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටකොටකළොත ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරනු ලැබේ.
(j) අවුරුදු 30කට වරක් බද්ද අළුත්වැඩියා කෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙවිවෑවූ බදු මුදලින් භාගයකට වැඩිනොවේ.
(k) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කිරීමටවත්, භාරදීමට හෝ ලියා දීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කිරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1919ක්වූ ජූනි මස 24වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 1,005, P. of S.**—සබරගමු දිසාවේ රත්නපුරේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 14වෙනි දිනවූ බෘහස්පතින්ද පස්වරු 1ට රත්නපුරේ කච්චේරියේදී විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 9ක්.

සිතියම 2,475. ගම—අකරැල්ල, මැදකෝරළේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව. අකරැල්ලවත්තට විකිනීම පිණිසයි.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1325B | තහන්දිමුකලාන | — | මූකලාන | 32 0 34 | 150 |
| 1326 | එම | — | එම | 1 2 8 | —* |
| 1330 | එම | — | එම | 4 1 5 | —† |

සිතියම 2,678. ගම—යද්දෙහිකන්ද, මැදකෝරළේ. අයිතිකමකියන්නා—ආර්. ආසිපිල්ලේ සහ තවත් අය.

උරුමක්කාරයින්ට ආණ්ඩුවෙන් නිදහස් පත්‍රයක් දීම පිණිසයි.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | බලන්ගොඩ උඩවත්ත. | ආර්. ආසිපිල්ලේ | තේ වවාපු ඉඩම | 0 1 6 | — |
| 2 | එම | එම | එම | 31 0 34 | — |
| 3 | පල්ලෙගෙඅරව | — | කුඹුර | 0 2 22 | — |
| 4 | කපුකොරටුවේවත්ත | — | වත්ත | 1 0 17 | — |
| 5 | බලන්ගොඩඋඩවත්ත | ආර්. ආසිපිල්ලේ | තේ වවාපු ඉඩම | 23 0 35 | — |
| 6 | කරවුගහවත්ත | — | වත්ත | 2 0 21 | — |
| 7 | කළුන්දයවත්තේතැලේ | ආර්. ආසිපිල්ලේ | මූකලාන | 0 2 35 | — |
| 8 | කළුන්දයවත්තේහේන | එම | ලන්ද | 5 0 19 | — |

* අඩි පාර ආරක්ෂක බිම්කැබෙල්ල, විකුණනු නොලැබේ. † කරදන දෙල ආරක්ෂක බිම්කැබෙල්ල, විකුණනු නොලැබේ.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණ සබරගමු පලාතේ රත්නපුරේ ආණ්ඩුවේ මහඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1919ක්වූ ජූනි මස 21වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 5,168, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ජූලි මස 31වෙනි දිනවූ බෘහස්පතින්ද පෙරවරු 11ට නොච්චියාගමදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය පලාතේ නුවරගම් කොඨාසයේ විලච්චියකෝරළේ පිහිටාතිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ සිතියම 726. ගම—ඇහැටුවාගම.

| නො. | ඉඩමේනම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2A | වෙල්කටුව නොහොත් අන් ආණ්ඩුව, ජයතිලකමුදියන්සෙලාගේ කිරිහාමිගේ තේහාමි දරලන්දේයාය | විසින් ඉල්ළුම්කර තිබේ | හේන | 0 3 27 |
| 5A | කරත්තපාර | එම | පාර | 0 0 18 |
| 6A | වෙල්කටුවේහේන | එම | හේන | 0 3 37 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1919ක්වූ ජූනි මස 25වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—තෙල් ස්ටෝරුව පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 16,991. ගම—දෙමටගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මාලිගාවත්ත | පොල් පැල 7ක් තිබේ | පෝල් කාසිසෙට්ටිගේ උරුමක්කාරයන් | 0 0 8·88 |
| 2 | එම | හිස් බිම | රජසන්තක | 0 0 2·69 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1919ක්වූ ජූලි මස 21වෙනි දින දවල් 12ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1919ක්වූ ජූනි මස 20වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රෙසර්,
ආණ්ඩුවේ ඒජන්ත වර්‍ගය.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—තොන්ඩිල පාඨශාලාව සඳහා මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මනත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 11,245. ගම—බතිගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගුරුකන්දවත්ත | පොල්ගස් සහිත ඉඩම | දික්වැල්ලේ දෙන් දවිත් තිර්මාමුනි සහ තවත් අය | 0 2 35·6 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1919ක්වූ අගෝස්තු මස 9වෙනි දින පස්වරු 3නේ කනිසමට දික්වැල්ලේ නානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1919ක්වූ ජූනි මස 20වෙනි දින
මාතර කච්චේරියේදීය.

ටී. රීඩ්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍ගය.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කුරුණෑගල දැන්වීම නො. 7,266.]

වර්ෂ 1919ක්වූ ජූනි මස 27වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලක්න් එකී ඉඩම්වලට නොහොත් ඒට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්නට නොයෙදුන සෑම ඉඩම් රාජසන්තක ඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කිරීම ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කිරීම හැටියට බාරගනු ලැබේ.

ජේ. ඇම්. ඩේවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දේවමැදිහත්පත්තුවේ අන්ගොමුකෝරළේ කුරුන්දවල යන ගම පිහිටාතිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—මුල් සිතියම 4,203.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| O 62 | පාඅත්තරාවෙිහේන්යාය | 28 3 23 |
| P 62 | පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 1 22 |
| X 62 | කුරුන්දවලහේන්යාය (පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය) | 0 0 17 |
| | | 29 1 22 |

මීට මායිම්—උතුරට රදලියගොඩ යන ගමේ ගම්ඉමද (ලූකස් ප්‍රනාන්දු උන්නැහෙ විසින් අයිතිකම්කියන දෙබැන්දවලහේනද); නැගෙණහිරට ආණ්ඩුවේ මූකලාන වන පත්රාවෙිකන්දද; දකුණට කටුගම්පොලහත්පත්තුවේ ඉමද, වැලිවේරිය ලියනගේ සයිමන් ප්‍රෙරා අප්පුහාමි විසින් අයිතිකම්කියන පත්රාවෙිහේන්යාය නොහොත් දන්ගොල්ලේවත්තද, සයිමන් ප්‍රෙරා විසින් අයිතිකම්කියන පතිරවහේනද (පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය), අන්තෝනි මූප්පුරාල විසින් අයිතිකම්කියන කුරුන්දවලයායද (පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය); බස්නාහිරට ගල්දුමුදියන්සේලාගේ හතන්හාමි සහ රෙන්ගමුවේ ගුනරත්හාමි විසින් අයිතිකම්කියන කුරුන්දවල්හේන්යායද, ලූකස් ප්‍රනාන්දු උන්නැහ සහ තවත් අය විසින් අයිතිකම්කියන කුරුන්දවලහේනුවත්තද (පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය), රදගමට යන පාරද.

II.—මුල් සිතියම 4,203.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| Y 62 | පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය | 0 0 39 |
| A 63 | එම | 0 0 20 |
| C 63 | එම | 0 1 17 |
| | | 0 2 36 |

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 872—873වෙනි පිටුවල ප්ලෑන් බලනු.

මීට මායිම්—උතුරට ගල්ලොළුමුදියන්සේලාගේ හතන්හාමි සහ කරන්ගමුවේ ගුනරත්හාමි විසින් අයිතිකම්කියන කුරුන්දවලගෙන්යායද, රදගම හිට කටුපොතට යන පාරද: නැගෙණහිරට මැදකැටියකෝරලේ ඉඹද; දකුණට ගල්ලොළුමුදියන්සෙලාගේ හතන්හාමි සහ කරගමුවේ ගුනරත්හාමි විසින් අයිතිකම්කියන බටගල්ලගලගාවාහේනද, වි. ඇම්. මානෙල් හාමි විසින් අයිතිකම්කියන පත්රවෙවිවෙල්යායද, කටුපොත හිට මූනමල්දෙනියට යන පාරද; බස්නාහිරට ඈප්. ජේ. ලූකස් ප්‍රනාන්දු උන්නැහෙ විසින් අයිතිකම්කියන පත්රවේගෙන්යායද.

[කුරුනෑගල වි. ම. 40—1919.]

---

[කුරුණෑගල දූන්වීම නො. 7,267.]

වර්‍ෂ 1919ක්වූ ජූනි මස 27වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වා සිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණබව මෙයින් දැනගතයුතුයි.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ජේ. ඇම්. ඩේවිස්,
ඉඩමේ තොරතුරු. විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

වයඹ දිසාවේ කුරුනෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොලහත්පත්තුවේ මැද්දේකැටියේකෝරලේ කරන්ගොමුව යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන 4,203 මුල් සිතියමේ D 63න් පෙනෙන පර්චස් 28ක් බිම්තරම ඇති සාමාන්‍ය වැයෙන් පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට අත්තොමු කෝරලේ ඉඹද; නැගෙණහිරට කටුපොත හිට කරන්ගොමුවට යන පාරද; දකුණට කේ. ලේකම් සහ තවත් අය විසින් අයිතිකම්කියන බටගල්ලහලගාවාහේනද; බස්නාහිරට ගල්ලොළුමුදියන්සේලාගේ පුන්චප්පුහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන හබහේනද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 873වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුනෑගල වි. ම. 41—1919.]

---

[කුරුනෑගල දූන්වීම නො. 7,268.]

වර්‍ෂ 1919ක්වූ ජූනි මස 27වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900යේ සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරන බව මෙයින් දැනගත යුතුයි.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට බාරගනු ලැබේ.

ජේ. ඇම්. ඩේවිස්,
ඉඩම්වල තොරතුරු. විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

වයඹ දිසාවේ කුරුනෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොලහත්පත්තුවේ මැද්දේකැටියේකෝරලේ කුඹුක්කොටුව යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

මුල් සිතියම 4,527.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| R 115 | කනුකැටියේවත්ත | 15 | 2 | 2 |
| S 115 | එම | 9 | 3 | 18 |
| | | 25 | 1 | 20 |

මීට මායිම්—උතුරට ආර්. බන්ඩිරල විසින් අයිතිකම්කියන මීගහමුලවත්තද, එච්. පුන්චප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියනනුගගහකුඹුරේපිල්ලෑවද, එම අය විසින් අයිතිකම්කියන නුගගහකුඹුරද, එච්. පුන්චප්පුහාමි විසින් අයිතිකම් කියන නුගගහකුඹුරේපිල්ලෑවද, දේවාලගලද, මේරි විජේසේකර විසින් අයිතිකම්කියන කනුකැටියේවත්තද; නැගෙණහිරට මේරි විජේසේකර විසින් අයිතිකම්කියන කනුකැටියේවත්තද, බැමිනිකල යන ගමේ ගම්ඉමද, වැවකන්ඩියට ඉතුරුකර තිබෙන රජසන්තක දන්ගොල්ලේදෙනියද, (සී. එච්. ඔබේසේකර මැතිනි විසින් අයිතිකම්කියන ඇන්දගලයායද); දකුණට (ප්‍රවෙනි) කනුකැටියවත්තද, ඉඩමේ ආරක්‍ෂක රේඛාවද; බස්නාහිරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිඩකරපු කිටලාව හිට කටුපොතට යන පාර සහ ඉතුරුකර තිබෙන බිම්කට්ටියද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 874වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුනෑගල වි. ම. 42—1919.]

---

[කුරුනෑගල දූන්වීම නො. 7,269.]

වර්‍ෂ 1919ක්වූ ජූනි මස 27වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ජේ. ඇම්. ඩේවිස්,
විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුනෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොලහත්පත්තුවේ යගම්පත්තුකෝරලේ කැබෙල්ල-අගාරේ යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන 4,540 මුල් සිතියමේ 6න් පෙනෙන රූඩ් 1කුත් පර්චස් 2ක් බිම්තරම ඇති සාමාන්‍යවසයෙන් (මිනිපිච්චනිය) කියන නොහොත් ඒ නමින් දනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට 302,773 පිඹුරු කබඩසියේ පෙනෙන ඉඩමද; නැගෙණහිරට කොළඹ පදිංචි එච්. ජේ. පීරිස් විසින් අයිතිකම්කියන මඩුගස්අගාරේවත්තද; දකුණට සහ බස්නාහිරට 302,773 පිඹුරුකබඩසියේ පෙනෙන ඉඩමද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 875වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුණෑගල වි. ම. 43—1919.]

---

[කුරුනෑගල දූන්වීම නො. 7,270.]

වර්ෂ 1919ක්වූ ජූනි මස 27වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ජේ. ඇම්. ඩේවිස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දනගත යුතුයි.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ජේ. ඇම්. ඩේවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුනෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොල හත්පත්තුවේ යගම්පත්තුකෝරලේ පරනගම යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන 4,789 මුල් සිතියමේ 2න් පෙනෙන පර්චස් 11ක් බිම්තරම ඇති සාමාන්‍ය වසයෙන් පටුමාවත (පටුවාවතෙන් කොටසක්) කියන නොහොත් ඒ නමින් දනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට හේරත් සිංඤෝ විසින් අයිතිකම්කියන කහටගහමුලවත්තද; නැගෙණහිරට බන්ඩිරාල සහ තවත් අය විසින් අයිතිකම්කියන බදුවත්තද, ආණ්ඩුව විසින් විකුනාපු කහටගහමුලවත්තද; දකුණට මහපාරේ සිට ගම්වලට යන ගම්සභාපාරද; බස්නාහිරට හේරත්සිංඤෝ විසින් අයිතිකම්කියන කහටගහමුලවත්තද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 875වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුනෑගල වි. ම. 44—1919.]

---

[කුරුනෑගල දූන්වීම, නො. 7,271.]

